© සියලුම හිමිකම් ඇවිරිණි

අනු අංකයඃ ………………

# ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනය
## අන්තර්මධ්‍ය අදියර
## 2009 සැප්තැම්බර්විභාගය

විභාග දිනය : 2009 සැප්තැම්බර් 12 පිටු ගණන : 08
විභාග වේලාව : පෙ.ව. 9.30 - ප.ව. 12.30 ප්‍රශ්න ගණන : 05

අයදුම්කරුවන්ට උපදෙස්ඃ

1. නියමිත කාලය පැය 3 කි.
2. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
3. පිළිතුරු සැපයිය යුත්තේ සිංහල භාෂාවෙන් පමණි.

| විෂය | විෂය සංකේතය |
|---|---|
| **මූල්‍ය ගිණුම්කරණය හා වාර්තාකරණය** | **(FAR / 601)** |

**ප්‍රශ්න අංක 01** (ලකුණු 18)

අනුර පීඑල්සී හි සහ බන්දුල පී.එල්.සී. 2009 මාර්තු 31 දිනට සකස් කරන ලද ශේෂපත්‍රයන් පහත වේ.

| | අනුර පී.එල්.සී. රු. '000 | බන්දුල පී.එල්.සී. රු. '000 |
|---|---|---|
| **වත්කම්** | | |
| **ජංගම නොවන වත්කම්** | | |
| **දේපල, පිරියත හා උපකරණ** | | |
| ඉඩම් | 1,800 | 1,200 |
| අනෙකුත් දේපල, පිරියත හා උපකරණ | 6,480 | 3,780 |
| සමුච්චිත ක්ෂය වෙන්කිරීම | (2,160) | (1,080) |
| | 6,120 | 3,900 |
| **ආයෝජන** | | |
| බන්දුල පී.එල්.සී හි ආයෝජන | 3,888 | - |
| වෙනත් ආයෝජන | 792 | 600 |
| | 10,800 | 4,500 |
| **ජංගම වත්කම්** | | |
| තොගය | 4,680 | 4,050 |
| ලැබිය යුතු ගිණුම් / ණයගැතියන් | 3,360 | 1,410 |
| ජංගම ගිණුම - අනුර පී.එල්.සී | - | 1,920 |
| මුදල් සහ මුදල් හා සමාන දෑ | 4,500 | 450 |
| | 12,540 | 7,830 |
| **මුළු වත්කම්** | **23,340** | 12,330 |
| **ස්කන්ධය හා බැරකම්** | | |
| **ප්‍රකාශිත ප්‍රාග්ධනය හා සංචිත** | | |
| **ප්‍රකාශිත ප්‍රාග්ධනය** | | |

| | | |
|---|---|---|
| සාමාන්‍ය කොටස් | 7,200 | 2,400 |
| වරණීය කොටස් | 2,400 | - |
| | 9,600 | 2,400 |
| **සංචිත** | | |
| පොදු සංචිත | 3,840 | 1,440 |
| රඳවාගත් ලාභය | 3,300 | 2,520 |
| | 7,140 | 3,960 |
| **ජංගම නොවන බැරකම්** | | |
| 18% ණයකර | 1,560 | 1,800 |
| බැංකු ණය | 1,200 | 1,200 |
| **ජංගම බැරකම්** | | |
| ගෙවිය යුතු ගිණුම් / ණයහිමියන් | 1,620 | 2,580 |
| ජංගම ගිණුම - බන්දුල පී.එල්.සී. | 1440 | - |
| ආදායම් බදු | 780 | 390 |
| | **23,340** | **12,330** |

**පහත අතිරේක තොරතුරු ඔබට දී ඇත.**

(1) අනුර පී.එල්.සී. විසින් බන්දුල පී.එල්.සී. හි සාමාන්‍ය කොටස් 72,000 ක් 2008 අප්‍රේල් 01 දින මිලදී ගෙන ඇති බන්දුල පී.එල්.සී. හි ප්‍රකාශ කළ ප්‍රාග්ධනය සාමාන්‍ය කොටස් 80,000 කින් සමන්විත වේ.

(2) 2008 අප්‍රේල් 01 දිනට බන්දුල පී.එල්.සී. හි තිබූ සංචිත ශේෂයන් පහත වේ.

| | | |
|---|---|---|
| පොදු සංචිතය | රු. | 780,000/- |
| රඳවාගත් ලාභය | රු. | 300,000/- |

(3) සමාලෝචිත වර්ෂය තුළදී බන්දුල පී.එල්.සී. විසින් රු.1,800,000/- කට භාණ්ඩ අනුර පී.එල්.සී. වෙත විකුණා ඇති අතර, එහිදී විකුණුම් මිල තීරණය කර ඇත්තේ, පිරිවැයට 20% ක ලාභයක් සහිතවයි. මෙලෙස අනුර පී.එල්.සී. විසින් මිලදී ගත් භාණ්ඩවලින් 50% ක් 2009/03/31 දින වන විට එම සමාගමේ තොගයෙහි ඉතිරිව තිබිණි.

(4) අත්පත් කරගත් දිනයේදී කොටසක් සඳහා ගෙවිය යුතු මිල තීරණය කිරීමේ පරමාර්ථයෙන් අනුර පී.එල්.සී විසින් බන්දුල පී.එල්.සී හි ඉඩම්වල සාධාරණ අගය රු. 1,800,000/- ක් සේ තීරණය කර ඇත. මෙම සාධාරණ අගය ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කළ යුතු වේ.

(5) පහත හේතූන් මත අන්තර් සමාගම් ජංගම ශේෂයන් තුළනය නොවේ.

(i) බන්දුල පී.එල්.සී විසින් අනුර පී.එල්.සී වෙත ඉන්වොයිස් කර ඇති රු. 360,000/- ක භාණ්ඩ තොග අනුර පී.එල්.සී වෙත ලැබී තිබුණේ 2009 අප්‍රේල් 04 වන දිනයි.

(ii) අනුර පී.එල්.සී විසින් බන්දුල පී.එල්.සී වෙත මාර්තු මාසයේදී කරන ලද ප්‍රේෂණයක් බන්දුල පී.එල්.සී වෙත ලැබී තිබුණේ 2009 අප්‍රේල් 10 දිනදීය.

(6) 2009.03.31 කරන ලද හානිකරණ පරීක්ෂාව අනුව එදිනට කීර්තිනාමය රු. 30,000/- ක් හානිකරණය වී ඇති බව අනාවරණය වී ඇත. මේ සඳහා ගැලපීම් කළ යුතු වේ.

2009 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අනුර පී.එල්.සී සහ එහි පරිපාලිතය සඳහා ඒකාබද්ධ ආදායම් ප්‍රකාශනය සකස් කරන්න. **(මුළු ලකුණු 18)**

**<u>ප්‍රශ්න අංක 02</u>** (ලකුණු 18)

(1) පහත අයිතමයන් විස්තර කරන්න.

(i) සාධාරණ වටිනාකම

(ii) ශුද්ධ උපලබ්ධි අගය

(iii) පරිපාලක සමාගම්

(iv) ආශ්‍රිත සමාගම්

(v) පාලනය (ලකුණු 05)

(2) සිටි බිල්ඩර්ස් සමාගම ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවක් භාරගෙන 2009 මාර්තු 31 වන විටත්, සම්පූර්ණ කරමින් පැවති අතර, එය ස්වභාවයෙන් ස්ථාවර මිල කොන්ත්‍රාත්තුවකි. කොන්ත්‍රාත්තුව සඳහා 2009 මාර්තු 31 දින වන විට දරා තිබූ මුළු පිරිවැය රු. 1,154,000/- ක් වූ අතර, කොන්ත්‍රාත්තුව සම්පූර්ණයෙන්ම නිම කිරීම සඳහා තවදුරටත් දැරීමට සිදුවන පිරිවැය රු. 936,000/- ක් වශයෙන් ඇස්තමේන්තුකර ඇත. කොන්ත්‍රාත්තුවේ අගය රු. 2,700,000/- කි. ශ්‍රී.ල.ගි.ප්‍ර. 13 ප්‍රකාරව 2009 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනයෙහි වාර්තා කළ යුතු කොන්ත්‍රාත් ලාභය / අලාභය ගණනය කරන්න. (ලකුණු 04)

(3) ''සංසන්දනාත්මකභාවය'' ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත්කර ඇති මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ ආකෘතියෙහි හඳුනාගෙන ඇති, මූල්‍ය ප්‍රකාශනවල තිබිය යුතු එක් ගුණාංගයකි.

**පහත දෑ සඳහා පිළිතුරු සපයන්න.**

(i) සංසන්දනාත්මකභාවයෙහි අවශ්‍යතා දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) මූල්‍ය ප්‍රකාශනවල සංසන්දනාත්මකභාවය නම් වූ ගුණාංගය උසස් කරලීම සඳහා අනුගමනය කළ හැකි පියවරයන් තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(4) ශ්‍රී.ල.ගි.ප්‍ර. 18 - දේපල, පිරියත හා උපකරණ අනුව 2009 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ඔබ පහත දෑ පිළිබඳව අනුගමනය කරන ගිණුම් ක්‍රියාමාර්ගය සඳහන් කරන්න.

(i) සී/ස 'A' සමාගම 2006.10.01 දින රු. මිලියන 3 කට යන්ත්‍රයක් මිලදී ගන්නා ලදී. එම මිලදී ගත් අවස්ථාවේදී යන්ත්‍රයේ අපේක්ෂිත ජීවිත කාලය වර්ෂ 10 ක් සේ ඇස්තමේන්තු කළ අතර, සුන්බුන් අගයක් නැතැයි උපකල්පනය කරන ලදී. කෙසේවෙතත්, 2008.04.01 මෙම යන්ත්‍රයේ අපේක්ෂිත ජීවිත කාලය සමාලෝචනයට භාජනය කළ අතර, එහිදී අනාවරණය කරගන්නා ලද කරුණක් වූයේ මෙම යන්ත්‍රයේ ජීවිත කාලය වර්ෂ 4 ක් පමණක් බවයි. සමාගමේ ක්ෂය ප්‍රතිපත්තිය වන්නේ, යන්ත්‍ර සඳහා ඒවා පාවිච්චි කරන ලද කාලය හා සමානුපාතිකව වාර්ෂිකව සරල මාර්ග ක්‍රමයට 10% බැගින් ක්ෂය ප්‍රතිපාදනය කිරීමයි. (ලකුණු 02)

(ii) සී/ස 'C' සමාගම 2006.04.01 දින රු. මිලියන 4 කට පිරියතක් මිලදී ගත් අතර, එහි අපේක්ෂිත ජීවිත කාලය වර්ෂ 5 ක් සේ ඇස්තමේන්තුකර ඇත. සමාගම මෙම වත්කම සඳහා සුන්බුන් අගයක් නැතැයි උපකල්පනය කරමින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය ප්‍රතිපාදනය කරනු ලැබේ. මෙම පිරියත 2008.04.01 වෘත්තීය තක්සේරුකරුවන් රු. මිලියන 3 කට ප්‍රත්‍යාගණනය කර ඇති අතර, මෙම ප්‍රත්‍යාගණන අගය සඳහා මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් කිරීමට සමාගම තීරණය කර ඇත. (ලකුණු 02)

(මුළු ලකුණු 18)

__**ප්‍රශ්න අංක 03**__ __*(ලකුණු 28)*__

පහත ශේෂ පිරික්ෂුම සී/ස සරස සමාගමේ පොත්වලින් 2009 මාර්තු 31 දිනට උපුටාගෙන ඇත. (සියළුම සංඛ්‍යා රු. දහස්වලින් නිරූපණය කෙරේ.)

| | හර | බැර |
|---|---|---|
| ප්‍රත්‍යාගණන අතිරික්තය | | 2,400 |
| රඳවාගත් ලාභය | | 6,800 |
| 16% ණයකර | | 32,000 |
| විකුණුම් | | 299,060 |
| විකුණුම් පිරිවැය | 176,000 | |
| සේවක පිරිවැය | 36,000 | |
| මෝටර් වාහන (පිරිවැයට) | 11,200 | |
| ණයකර පොලී | 2,560 | |
| කාර්යාල උපකරණ (පිරිවැයට) | 6,400 | |
| අධ්‍යක්ෂකවරුන්ගේ පාරිශ්‍රමිකය | 3,540 | |
| ගොඩනැගිලි (පිරිවැයට) | 7,200 | |
| ඉඩම් (පිරිවැයට) | 12,000 | |
| බැංකු ශේෂය / අයිරාව | 9,840 | 2,432 |
| **<u>අතුරු ලාභාංශ ගෙවීම් - ශුද්ධ</u>** | | |
| සාමාන්‍ය කොටස් | 2,880 | |
| වරණීය කොටස් | 648 | |
| | | |
| **<u>2008.04.01 දිනට ක්ෂය සඳහා ප්‍රතිපාදන</u>** | | |
| ගොඩනැගිලි | | 2,160 |
| කාර්යාල උපකරණ | | 2,560 |
| මෝටර් වාහන | | 4,800 |
| දිගු කාලීන ආයෝජන | 25,200 | |
| වෙළඳ ආයෝජන | 640 | |
| පොලී ලැබීම් | | 320 |
| ලැබිය යුතු ගිණුම් / ගෙවිය යුතු ගිණුම් | 11,840 | 2,080 |
| ආදායම් බදු සඳහා ප්‍රතිපාදන | | 1,040 |
| අඩමාන ණය සඳහා ප්‍රතිපාදන | | 192 |
| ආදායම් බදු ගෙවීම් | 7,040 | |
| පරිපාලන වියදම් | 21,760 | |
| විකුණුම් හා බෙදාහැරීම් | 24,400 | |
| වෙනත් වියදම් | 11,520 | |
| අතැති මුදල් | 952 | |
| 2009.03.31 දිනට තොගය | 20,824 | |
| | | |
| **<u>ප්‍රකාශිත ප්‍රාග්ධනය</u>** | | |
| සාමාන්‍ය කොටස් (කොටස් 1,800,000) | | 27,000 |
| වරණීය කොටස් (කොටස් 600,000) | | 7,200 |
| පොදු සංචිතය | | 2,400 |
| | **392,444** | **392,444** |

**පහත සඳහන් අතිරේක තොරතුරු ඔබ වෙත සපයා ඇත.**

(1) පහත දේපල, පිරියත හා උපකරණ අයිතමයන් සමාලෝචිත ගිණුම් වර්ෂය තුළදී සමාගම විසින් මිලදී ගෙන ඇති අතර, ඒවා සඳහා නිසිපරිදි ගිණුම්කරණය කර ඇත.

| | | | |
|---|---|---|---|
| කාර්යාල උපකරණ | රු. 2,400,000 | - මිලට ගත් දිනය - | 2008.07.01 |
| මෝටර් වාහන | රු. 3,200,000 | - මිලට ගත් දිනය - | 2009.01.01 |

(2) සමාගම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 18 ට අනුකූලව තම ක්ෂය වන වත්කම් වෙනුවෙන් සරල මාර්ග ක්‍රමය අනුව ඒවා පාවිච්චි කරන ලද කාලයට සමානුපාතිකව පහත අනුපාතයන් මත ක්ෂය සඳහා ප්‍රතිපාදනයන් කරනු ලැබේ.

| | | |
|---|---|---|
| ගොඩනැගිලි | (වාර්ෂිකව) | 5% |
| කාර්යාලීය උපකරණ | (වාර්ෂිකව) | 10% |
| මෝටර් වාහන | (වාර්ෂිකව) | 20% |

(3) 2009 මාර්තු 31 දින වෘත්තීය තක්සේරු ආයතනයක් ලවා පහත දේපල සමාගම විසින් ප්‍රත්‍යගණනය කරවා ගන්නා ලදී. මෙම අගයන් මූල්‍ය ප්‍රකාශනවල ස්ථාපිත කිරීමට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය තීරණයක් ගෙන ඇති අතර, ඒ අනුව එම අගයන් මූල්‍ය ප්‍රකාශනවල නිරූපණය කරන ලෙසට ඔබට දන්වා ඇත.

| | |
|---|---|
| ඉඩම් | රු. 20,000,000/- |
| ගොඩනැගිලි | රු. 8,000,000/- |

(4) 16% ණයකර, සමාගම විසින් මීට වර්ෂ 5 කට පෙර නිකුත් කර ඇති අතර, ණයකර සඳහා පොලී ගෙවනු ලබන්නේ අර්ධ වාර්ෂිකව සැප්තැම්බර් 30 සහ මාර්තු 31 යන දිනයන්හීදීය.

(5) වර්ෂය තුළදී ගෙවන ලද ආදායම් බද්දෙන් රු. 1,280,000/- ක් ගෙවා ඇත්තේ පෙර වර්ෂයේ අවසාන ආදායම් බදු ගෙවීම වශයෙන් වන අතර, ඉතිරිය නියෝජනය කරන්නේ, 2008/2009 තක්සේරු වර්ෂය සඳහා ස්වතක්සේරු පදනම මත ගෙවන ලද ආදායම් බදු ප්‍රමාණයයි. 2008/2009 තක්සේරු වර්ෂය සඳහා ආදායම් බද්ද රු. 7,200,000/- වශයෙන් ඇස්තමේන්තු කර ඇත.

(6) රු. 120,000/- ක ණයක් බොල්ණය වශයෙන් කපාහැරිය යුතු අතර, 2009.0331 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂයන්ගෙන් පහත පරිදි අඩමාන ණය ප්‍රතිපාදනය කළ යුතුය.

| | |
|---|---|
| විශේෂ ප්‍රතිපාදන | රු. 20,000 |
| පොදු ප්‍රතිපාදන | 5% |

(7) වර්ෂය තුළදී ගෙවන ලද විගණන පාරිශ්‍රමිකය රු. 300,000/- පරිපාලන වියදම් වශයෙන් ඇතුළත් කර ඇත.

(8) වර්ෂය තුළදී සමාගම තම කොටස්හිමියන්ට අතුරු ලාභාංශ ලෙස ගෙවා ඇත්තේ, 10% ක රඳවාගත් බද්දක් අඩු කළ පසු ශුද්ධ ප්‍රමාණයයි. කෙසේවෙතත්, මෙලෙස අඩු කරගන්නා ලද රඳවාගත් බද්ද (10% WHT) සම්බන්ධයෙන් අවශ්‍ය ගැලපීම් කර නැත.

(9) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය පහත දෑ යෝජනා කරයි.

(අ) පොදු සංචිතය සඳහා රු. 500,000/- ක් මාරු කිරීම.

(ආ) වරණීය කොටස්හිමියන්ට වර්ෂයක් සඳහා කොටසකට රු.2.40 බැගින් වන පරිදි ඉතිරි ලාභාංශය ගෙවීම.

(ඇ) සාමාන්‍ය කොටස්හිමියන්ට කොටසකට රු. 1.50 බැගින් ලාභාංශ යෝජනා කිරීම.

**සී/ස සරස සමාගමේ 2008/2009 වර්ෂය වෙනුවෙන් ප්‍රකාශයට පත් කිරීම සඳහා පහත දෑ සකස් කරන්න.**

(a) 2009/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය (ලකුණු 10)

(b) 2009/03/31 දිනට ශේෂපත්‍රය (ලකුණු 07)

(c) 2009/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය (ලකුණු 04)

(d) දේපල, පිරියත හා උපකරණ, ප්‍රකාශ කළ ප්‍රාග්ධනය, වර්ෂයේ ශුද්ධ ලාභය හා යෝජිත ලාභාංශ වෙනුවෙන් අවශ්‍ය ගිණුම් සටහන් (ලකුණු 07)

**(මුළු ලකුණු 28)**

**<u>ප්‍රශ්න අංක 04</u>** *<u>(ලකුණු 23)</u>*

ආතර් සහ බර්ටි පිළිවෙලින් ලාභාලාභ 3:2 අනුපාතයට බෙදාගනිමින් හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යයි.

චතුර සහ ඩේවිඩ් පිළිවෙලින් 2:1 අනුපාතයට ලාභාලාභ බෙදාගනිමින් ඒ හා සමානම හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලැබේ.

2009.03.31 දිනට හවුල් ව්‍යාපාර දෙකම සකස් කරන ලද ශේෂ පිරික්සුම් පහත දී ඇත. හවුල් ව්‍යාපාර දෙකේම ගිණුම් වර්ෂය අප්‍රේල් 01 දිනෙන් ආරම්භ වී ඊළඟ වර්ෂයේ මාර්තු 31 දින අවසන් වේ.

*(සියළුම සංඛ්‍යා රු.'000 වලිනි.)*

| හර | ආතර් හා බර්ටි | චතුර හා ඩේවිඩ් |
|---|---|---|
| කාර්යාල උපකරණ - ලියාහල අගය | 50,000 | 25,600 |
| මෝටර් වාහන - ලියාහල අගය | 25,200 | 30,000 |
| තොගය | 67,600 | 69,600 |
| මුදල් සහ මුදල් හා සමාන දෑ | 9,600 | 6,000 |
| වෙළඳ ලැබිය යුතු ගිණුම් | 40,400 | 46,960 |
| විකුණුම් පිරිවැය | 231,200 | 208,800 |
| පරිපාලන වැය | 42,960 | 34,720 |
| බෙදාහැරීමේ පිරිවැය | 34,000 | 29,920 |
| ගැනිලි | 2,640 | 5,600 |
| | **503,600** | **457,200** |

| බැර | ආතර් හා බර්ටි | චතුර හා ඩේවිඩ් |
|---|---|---|
| විකුණුම් | 330,400 | 298,400 |
| වෙළඳ ගෙවිය යුතු ගිණුම් | 33,600 | 34,800 |
| **<u>හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම්</u>** | | |
| ආතර් | 72,000 | |
| බර්ටි | 40,000 | |
| චතුර | | 60,000 |
| ඩේවිඩ් | | 40,000 |
| **<u>හවුල්කරුවන්ගේ ජංගම ගිණුම්</u>** | | |
| ආතර් | 15,600 | |
| බර්ටි | 12,000 | |
| චතුර | | 14,000 |
| ඩේවිඩ් | | 10,000 |
| | **503,600** | **457,200** |

**පහතින් දක්වා ඇති තොරතුරු විශේෂයෙන්ම ආතර් සහ බර්ටි හවුල් ව්‍යාපාරයට අදාල වේ.**

(1) ආතර් සහ බර්ටි සමාලෝචිත වර්ෂය තුළදී තම ප්‍රයෝජනයට ව්‍යාපාරයෙන් භාණ්ඩ ගෙන ඇත. එලෙස ලබාගන්නා ලද භාණ්ඩවල අගය පිළිවෙලින් රු. 100,000/- ක් සහ 120,000/- ක් වන අතර, මේ පිළිබඳව ගිණුම් පොත්වල සටහන් තබා නැත. බර්ටිට මාසිකව රු. 40,000/- බැගින් වැටුපක් ලබාගැනීමට හවුල් ගිවිසුමෙන් අවශ්‍ය ප්‍රතිපාදන සලසා ඇත.

(2) හවුල්කරුවන්ගේ මුදල් ගැනිලි පහත වේ.

ආතර් රු. 1,800,000/-

බර්ටි රු. 840,000/-

(3) ලැබිය යුතු ගිණුමේ ඇතුළත් රු. 300,000/- ක ණයක් අයකරගත නොහැකි බව තහවුරු වී ඇත.

**පහතින් දක්වා ඇති තොරතුරු චතුර සහ ඩේවිඩ් හවුල් ව්‍යාපාරයට අදාල වේ.**

(1) හවුල්කරුවන්ගේ මුදල් ගැනිලි පහත වේ.

චතුර රු. 3,600,000/-

ඩේවිඩ් රු. 2,000,000/-

**නව හවුල් ව්‍යාපාරය සඳහා අදාල පොදු කරුණු**

(1) උක්ත හවුල් ව්‍යාපාර දෙක සංගතවීමට තීරණයකර ඇති අතර, 2009 අප්‍රේල් 01 දින සිට නව හවුල් ව්‍යාපාරයක් "ABCD ට්‍රේඩර්ස්" නමින් සංස්ථාපිත කරන අතර නව හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවන් ලාභාලාභ ආතර්, බර්ටි, චතුර හා ඩේවිඩ් අතර 4:3:2:1 අනුපාතයට බෙදාගනු ලැබේ. මේ හැරෙන්නට හවුල් ව්‍යාපාර දෙකෙහි කීර්තිනාම අගයන් පහත ලෙස තීරණය කරන ලදී.

ආතර් හා බර්ටි රු. 800,000/-

චතුර හා ඩේවිඩ් රු. 600,000/-

(2) දේපල, පිරියත හා උපකරණවල 2009.04.01 දිනට සාධාරණ අගයන් පහත වේ.

| | ආතර් හා බර්ටි | චතුර හා ඩේවිඩ් |
|---|---|---|
| කාර්යාල උපකරණ | 60,000,000 | 30,000,000 |
| මෝටර් වාහන | 30,000,000 | 35,200,000 |

(3) නව හවුල් ව්‍යාපාරයේ පොත්වල කීර්තිනාම ශේෂය නොපෙන්විය යුතුය.

**පහත දෑ සකස් කරන්න.**

(i) හවුල් ව්‍යාපාර දෙකම සඳහා 2009 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභාලාභ විසර්ජන ගිණුම. **(ලකුණු** 04)

(ii) හවුල් ව්‍යාපාර දෙකෙහි හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන හා ජංගම ගිණුම්. **(ලකුණු** 12)

(iii) නව හවුල් ව්‍යාපාරය වන ABCD ට්‍රේඩර්ස් හි 2009 අප්‍රේල් 01 දිනට ආරම්භක ශේෂපත්‍රය. **(ලකුණු** 07)

**(මුළු ලකුණු 23)**

<u>**ප්‍රශ්න අංක 05**</u> *(ලකුණු 13)*

පහත දී ඇත්තේ තනි පුද්ගල ව්‍යාපාරිකයෙක් සම්බන්ධයෙන් අදාල දත්තයන් වන අතර, ඔහු තම ව්‍යාපාර කටයුතු තවදුරටත් පුළුල් කිරීම සඳහා බැංකුවෙන් ණයක් අයදුම්කර ඇත.

| | (රු.'000) |
|---|---|
| විකුණුම් | 48,000 |
| පරිභෝජනය කළ ද්‍රව්‍ය | 23,400 |
| වෙනත් කම්හල් පරිභෝජන ද්‍රව්‍ය | 2,400 |
| සෘජු ශ්‍රම පිරිවැය | 3,000 |
| අනෙකුත් සෘජු පිරිවැය | 1,400 |
| පරිපාලන වැය | 2,600 |
| විකුණුම් වියදම් | 1,150 |
| පොලී | 2,050 |
| ස්ථාවර වත්කම් / දේ.පි.උ. | 32,000 |
| වර්ෂයේ ක්ෂය වියදම | 1,400 |
| ප්‍රාග්ධනය | 15,000 |
| සංචිත හා අතිරික්තය | 4,000 |
| සුරැකුම් ණය | 9,000 |
| අනාරක්ෂිත දීර්ඝකාලීන ණය | 3,000 |
| වෙළඳ ණයහිමියන් / ගෙවිය යුතු ගිණුම් | 5,650 |
| දිගු කාලීන ආයෝජන | 2,000 |
| වර්ෂයේ ආරම්භක වෙළඳ තොගය | 2,000 |
| වර්ෂයේ අවසාන වෙළඳ තොගය | 6,000 |
| වෙළඳ ණයගැතියන් / ලැබිය යුතු ගිණුම් | 7,400 |
| අතැති මුදල් හා බැංකු | 3,300 |
| ප්‍රතිපාදන | 1,300 |
| අනෙකුත් ජංගම බැරකම් | 1,400 |
| කම්හල් පොදු කාර්ය පිරිවැය | 2,600 |

උක්ත ව්‍යාපාරය සඳහා පහත අනුපාතයන් ගණනය කරන මෙන් ඔබෙන් ඉල්ලා සිටී.

(i) දළ ලාභ අනුපාතය

(ii) ශුද්ධ ලාභ අනුපාතය

(iii) තොග පිරිවැටුම් අනුපාතය

(iv) ජංගම අනුපාතය

(v) ක්ෂණික වත්කම් අනුපාතය

(vi) ණය ස්කන්ධ අනුපාතය

(vii) යෙදවූ ප්‍රාග්ධනයට ප්‍රතිලාභ අනුපාතය (මුළු ලකුණු 13)

*ප්‍රශ්න පත්‍රය අවසානයි*